# සංරක්ෂණය කලයුතු රතමිල්ල ශාකය

M.G. මනෝජ් ප්‍රසන්න
mprasanna74@yahoo.com

කඩොලාන යනු ලෝකයේ ඝර්ම කලාපීය රටවල කලපු, ගංමෝයවල්, බොකු හා ලවණ වගුරු ආශ්‍රිතව හමුවන සුවිශේෂී ශාක ප්‍රජාවකි. අතිවිශේෂ පරිසර පද්ධතියක් වන කඩොලාන එම පරිසරයේ ඇති ශුෂ්ක තත්වයන් ජයගැනීමට නොයෙක් අනුවර්තන දක්වයි. ජලාබුජතාව, ලවණශ්‍රාවී ග්‍රන්ථී, ඝණ ගුරුත්වාවර්තී සහ කයිරු මුල් ඉන් ප්‍රධාන තැනක් ගනී. කෙසේ නමුත් මෙම අනුවර්තන හේතුවෙන් කඩොලාන අධික නිෂ්පාදනයක් සහිත ශාකයක් වේ. මෙම අධික නිෂ්පාදනය  හේතුවෙන් මෙම ශාක ජීවත්වන ජලජ පරිසරයට කාබනික ආහාර එක්කරමින් ආහාර දාම සහ ආහාර ජාල ඔස්සේ අධික ශක්තියක් ලබාදේ. එමෙන්ම මෙම සුවිශේෂී ශාක වල ඇති ඝණ ගුරුත්වාවර්තී සහ කයිරු මුල් අතර කාබනික ද්‍රව්‍ය හා රොන්මඩ රඳවා ගනිමින් කුඩා ජලජ සතුන්ට මනරම් මෙන්ම ආරක්ෂිත වාසස්ථාන නිර්මාණය කරයි.

ක්ෂීරපායීන්, පක්ෂීන්, මත්සයින්, මෙන්ම උරගයන්,  උභයජීවීන්, මොලස්කාවන් සහ ක්‍රස්ටේෂියාවන් යන සියලුම සත්ව කාණ්ඩයන්ට නිවහනක් වූ කඩොලාන පරිසරය සැබවින්ම ජෛව විවිධත්වයෙන් අනූන පරිසර පද්ධතියකි තවද වෙරළාසන්නයේ ඇති දැඩි සුළං මුහුදුරළ වැනි විනාශකාරී ශක්තීන් අවශෝෂණය කරමින් වෙරළ කළාපයේ ආරක්ෂාව තහවුරු කිරීම මෙම සුන්දර මෙන්ම සංවේදී පරිසරය ඉටුකරන නිහඬ කාර්ය භාරයකි.

ලෝක කඩොලාන ප්‍රජාව සැලකූ කල එය අත්කරගන්නා මුළු භූමිප්‍රමාණය හෙක්ටයාර මිලියන 18 -20 ක් පමණ වේ යැයි ගණන් බලා ඇත.  මින් 41.5 % පමණ ඇත්තේ ආසියාතික රටවල් ආශ්‍රිතවයි.  නමුත් අද වන විට ලංකාවේ දක්නට ඇත්තේ හෙක්ටයාර 6080ක් තරම් කුඩා බිම් කඩකි. මීට දශක දෙකකට එපිට ශ්‍රී ලංකාවේ හෙක්ටයාර 12500 පමණ වාර්තා වූ අතර අද වන විට ඉන් 50% පමණ අඩුවී ඇතිබව වෙරළ සංරක්ෂණ දෙපාර්තුමේන්තු වාර්තා පෙන්වා දෙයි. මෙම තත්වයට නූතන කාලයේ පැවති යුද්ධමය වාතාවරණය සහ ඉස්සන්වගාව ඍජුවම බලපා ඇතිබව පැහැදලිය.

ලෝකය පුරාවට කඩොලාන විශේෂ 60 -70  පමණ වාර්තා වන අතර ඉන් විශේෂ 20 පමණ මෙම කුඩා  දිවයින තුල වාර්තාවේ. නමුත් මෙය අනෙක් රටවලට සාපේක්ෂව ඉහල අගයකි.

මෙම විශේෂ අතුරින් බෙහොහොමයක් විශේෂ රටවටා හොඳ ව්‍යාප්තියක් පෙන්වන අතර විශේෂ කිහිපයක් වියළි කලාපයට පමණක් සීමාවී ඇත. ශ්‍රී ලංකාවේ වාර්තාවන කඩොලාන විශේෂ අතුරින් මුට්ටි කඩොල් (Xylocarpus granatum), කළු කඩොල් (Scyphiphora hydrophyllacea) සහ රතමිල්ල (Lumnitzera littorea) යන කඩොලාන දැඩි ලෙස තර්ජනයට ලක්ව ඇත. නමුත් මේ අතුරින් රතමිල්ල වලට ඇති තර්ජනය ඉතා සුවිශේෂී වන්නේ එම ශාකය හමුවන්නේ එකම ස්ථානයක බැවිනි.


*Lumnitzera littorea*


*Xylocarpus granatum*


*Scyphiphora hydrophyllacea*

ශාක වර්ගීකරණයට අනුව රතමිල්ල ( *Lumnitzera littorea* ) ශාකය පහත දක්වා ඇති ලෙස වර්ගකර ඇත.

| | | |
|---|---|---|
| Kingdom (රාජධානිය) | - | Plantae (Plants) |
| Sub Kingdom (උප රාජධානිය) | - | racheobionta |
| Division (කාන්ඩය) | - | Magnoliophyta |
| Class (වර්ගය) | - | Magnoliosida |
| Sub Class (උප වර්ගය) | - | Rosidae |
| Order (ගෝත්‍රය) | - | Myrtalss |
| Family(කුලය) | - | Combretaceae |
| Genus (ඝණය) | - | *Lumnitzera* |
| Species (විශේෂය) | - | *Lumnitzera littorea* |



රතමිල්ල (*Lumnitzra littorea*) ශාක

මෙය Combretaceae කුලයට අයත්වේ. බෑරිය (Lumnitzra racemosa) වලට වඩා මදක් වෙනස් වන අතර රතමිල්ල ලෙස හඳුන්වයි. ජලාබුජ ප්‍රරෝහණය නොපෙන්වන කඩොලාන ශාකයකි. මෙම ශාකය ආසියාතික රටවල සහ උතුරුදිග ඕස්ට්‍රේලියාවේ බහුලව හමුවූ නමුත් මේ වන විට මිනිසාගේ විවිධ නොමනාකම් හේතුවෙන් වඳවීයාමේ තර්ජනයට ලක්වී ඇත. අදවන විට මෙම ශාකය චීනයේ මෙන්ම ශ්‍රී ලංකාවේ ඉතා දුර්ලභ විශේෂයක් බවට පත්වී ඇත. චීනය ඇතුළු ඉන්දු බටහිර පැසිපික් (Indo- West Pacific) කළාපයේ මෙම ශාකය වඳවීමේ තර්ජනයට පත් ශාකයක් ලෙස හඳුන්වා දී ඇති ශ්‍රී ලංකාවේ ද මෙම ශාකය 1998 රතු දත්ත වාර්තාවේ දැඩි ලෙස තර්ජනයට පත් ශාකයක් ලෙස හඳුන්වා දී ඇත.

මෙම ශාක මීටර් 15-20 ක් හෝ ඊට විශාල ලෙස වර්ධනය වේ. කඩොලාන ප්‍රජාව තුල ලවණතාව වැඩි සහ වඩාත් ගොඩබිමට වන්නට මෙම ශාකය ස්ථාන ගතවේ. ගස අඳුරු පැහැතිය. කඳ පාදස්ථයෙන් විශාල වන අතර මුල් පොළොව මතුපිටින් වර්ධනය වේ. හොඳින් මේරූ ශාක වල කුඩා දණිස් මුල් දක්නට ඇත.

මේවා වඩදිය මට්ටමේ හෝ ඊට ඉහල මට්ටම් වල වර්ධනයවේ. Lumnitzra littorea වල පත්‍ර Lumnitzra racemosa වල පත්‍ර වලට වඩා මදක් විශාලවේ. ශාකය ඉහලින් අතු බෙදී ඇති අතර, වියනක ආකාරයට සකස්වී ඇත.



*Lumnitzra littorea* කුඩා දණිස් මුල්

සාමාන්‍යයෙන් රතමිල්ල (Lumnitzra littorea) ශාකයේ පුෂ්ප මංජරියක් ඇති අතර එය පත්‍ර අග්‍රයේ හෝ පාර්ශවික අතු වල දැකිය හැක. පුෂ්පයේ පෙති 04 ක් ඇත. රතු පැහැතිය. මේ නිසා මෙම ශාකය බෑරිය වලින් වෙන්කොට හොදින් හදුනාගත හැක.

ශ්‍රී ලංකාවේ මෙම ශාකය දැනට ස්වාභාවිකව වාර්තා වන්නේ මාදුගඟ අශ්‍රිත කඩොලාන ප්‍රජාවේ පමණි. මෙහි කඩොලාන පරිසරය තුල කඩොලාන විශේෂ 11ක් වාර්තා වන අතර රතමිල්ල ගස් ඇත්තේ 21 ක් පමණි. මෙම ශාක කිහිපය පාතමුල්ල ප්‍රදේශයේ පෞද්ගලික ඉඩමක වර්ග මීටර 500 පමණ කුඩා බිම් කොටසක දක්නට ඇත.



රතමිල්ල (*Lumnitzra littorea*) පුෂ්ප මංජරිය

මෙම විශේෂය 1998 රතුදත්ත පොතේ තර්ජනයට ලක්වූ ශාකයක් වශයෙන් හදුන්වා දී ඇත. මේ නිසා මෙම ශාකය ආරක්ෂා කලයුතු තත්වයක ඇතත් මේ දක්වා ඒ සදහා විශේෂ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

රතමිල්ල (Lumnitzra littorea) වල අප්‍රේල් සහ මැයි මාසයේ දී මල්හට ගනී. මෙම ශාකයේ විශාල වශයෙන් මල් ඇතිවන අතර ජුනි සහ ජූලි මාසවලදී ඵල සෑදේ. ඵල ද පුෂ්ප මෙන් විශාල වශයෙන් දක්නට ලැබීම සුලභ දසුනක් වුවද පසුගිය වසර 100 ක පමණ මෙහි පැල හටගැනීම කිසිවෙකුටත් වාර්තා වී නොමැත.

මෙම ස්ථානයේ බීජ ප්‍රරෝහණය නොවීමට හේතුව පසේ ඇති දුර්වල කමක්ද එසේත් නොමැතිනම් වෙනත් හේතුවක්ද යන්න කිසිවෙකුත් ඉදිරිපත් කර නැත. කෙසේනමුත් වසර කිහිපයක්ම මෙම බීජ පරීක්ෂා කිරීමේදී මෙම පරිණත බීජ වලින් 90% ට වැඩි ප්‍රතිශතයක් කිසියම් කෘමි හානියකට ලක්ව ඇතිබව පෙණුනි. බොහෝවිට මෙම තත්වයට හේතුව එසේ බීජ හානිවීම වියහැක. එමෙන්ම මෙම බීජවල කලලය ප්‍රරෝහණය වීමට සුදුසු මට්ටමට වර්ධනය නොවීතිබීමද මෙම තත්වයට බලපා හැකි බව පර්යේශකයෝ පෙන්වා දී ඇත.



රතමිල්ල (*Lumnitzra littorea*)ඵල

ශ්‍රී ලංකාවේ මෙම රතමිල්ල ශාක කිහිපයේ වටිනා කම බොහෝය. මෙම ගස් කීපය නිසා මාදුගගට ලැබුන වටිනාකම අතිමහත්ය. අද මෙම මාදුගග රැම්සා තෙත්බිමකි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් අභයභූමියකි, සංචාරක අමාත්‍යාංශය මගින් මෙය සංචාරක ප්‍රවර්ධන කලාපයක් වශයෙන් හදුවාදී ඇත. මීට අමතරව නොයෙකුත් රාජ්‍ය හා රාජ්‍යනොවන සංවිධාන මගින් අතිවිශාල මුදලක් වියදම්කර නොයෙකුත් කළමනාකරණ සැලසුම් ඉදිරිපත් කර ඇත.



රතමිල්ල ශාක සහිත ඉඩම හිමි කාන්තාව

පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය මගින් මෙම රතමිල්ල ශාක සහිත මාදුගග ඇතුළු තෙත් බිම ආශ්‍රිත හෙක්ටෙයාර 2300 පමණ භූමි ප්‍රදේශයක් 2006 වසරේ සිට අභයභූමියක් ලෙස ප්‍රකාශයට පත්කරන ලදි. මෙමගින් මෙම ශාක කිහිපයට යම් ආක්ෂාවක් ලැබුණද එමෙන්ම කොතෙකුත් නීතිමය තත්වයන් තිබුණද මෙම රතමිල්ල ගස් කිහිපය ආරක්ෂා කරගැනීමට කිසිදු ප්‍රායෝගික වැඩපිළිවෙලක් යොදා නොමැත. ශක්තිමත් මෙන්ම ඔරුවල කොල්ලෑව රැදවීමට අවශ්‍ය වක්වූ හැඩය සහිත මෙම ශාක සහ එහි අතු නිරන්තර තර්ජනයට ලක්ව ඇත. මෙම තත්වය මගහැරවීමට මෙහි වටිනාකම පිළිබඳ අවට ජනතාව මෙන්ම පාරිසරික සංචාරකයන් දැනුවත් කිරීමට දීර්ඝකාලීන වැඩපිළිවෙලක අවශ්‍යතාව පැහැදිලිය.

කෙසේ නමුත් වාසනාවකට මෙම ඉඩම අසල ජීවත්වන මෙන්ම මෙම වටිනා පරිසර පද්ධතියේ හිමිකාරිය වන වයස අවුරුදු 80 පමණ වන කාන්තාවක් විසින් මෙම ගස් කිහිපය ආරක්ෂා කරයි. කොතරම් නීති රීති අතරින් රිංගා ගියද මැයගෙන් රිංගා මෙම රතමිල්ල ශාකයෙන් කොලයක්වත් කැඩීමට අපහසුය. ඇය මෙම ශාක ආරක්ෂා කරනුයේ කඩොලාන ගැන හෝ පරිසර විද්‍යාව ගැන නොදැනය නමුත් මුළු රටටම මෙම ශාක ඇත්තේ තමාගේ ඉඩමේ පමණක් බව ඇය හොඳින් දනී. එමෙන්ම තමාගෙන් පසු මෙම ශාක වල ආරක්ෂාව පිළිබඳවද දෙගිඩියාවක් ඇය තුල ඇත.

එසේනම් පරිසරය වෙනුවෙන් හඩනගන සියළු සංවිධාන මෙන්ම ස්වභාව ධර්මයට වගකිව යුත්තන් වශයෙන් අප සියළු දෙනා එක් විය යුතු කාලය එළඹ ඇත. එසේ නැතහොත් දැනට දැඩි ලෙස තර්ජනයට ලක්වූ ශාක ලැයිස්තුවේ ඇති මෙම ශාකයට අනාගතයේ හිමිවන්නේ වඳවීගිය ශාක ලැයිස්තුවේ නම සටහන් කරගැනීමද යන්න පිළිබඳ සාධාරණ සැකයක් මතුවේ.